**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව - 2023**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**තත්ත්වාගණනය කළ මතය**

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.1 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.3 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.4 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 අප්‍රේල් 24 දින ගබඩාවට ලැබී තිබුණු UPS 04 ක වටිනාකම රු.58,000 ක් යන්ත්‍ර උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගන්නා බව | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. |
| (ආ) | 2023 ජනවාරි 01 දිනට ණයහිමි ශේෂය හා ගෙවිය යුතු ශේෂ උපලේඛනය අනුව වෙනස රු.159,466,238 ක් ශේෂය තහවුරු කර ගැනීමකින් තොරව කපා හැර තිබුණි. | පිළිගන්නා බව | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෝටර් ග්‍රේඩරයේ වටිනාකම රු.3,225,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබූ අතර රු.350,000 ක් වටිනා ජල බවුසරයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතුව භෞතිකව නොමැති අත්ට්‍රැක්ටරයක වටිනාකම රු.79,500 ක් කසළ කරත්ත 07 ක එකතු වටිනාකම රු.248,965 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට සේවක ණය ගිණුමෙහි දැක්වෙන ශේෂය රු.24,637,905 ක් වූ අතර එයට අදාළ උපලේඛනයේ ශේෂය රු.24,372,504 ක් වූයෙන් රු.265,401 ක නොසැසඳීමක් පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | මූල්‍ය ප්‍රකාශන ශේෂයන් සහ ඊට අදාළ උපලේඛන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 570 | වටිනාකම 9,000 ක් වූ ගෙවල් කුලී තැන්පතු හා රු.345,640 ක් වූ කර්මාන්ත තැන්පත් 06 ක් රෙගුලාසි ප්‍රකාරව නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | | | |
| (i) | 61 රීතිය | වාර්ෂික සමීක්ෂණයක් සිදුකර ලබා ගන්නා ලැයිස්තුවේ ඇතුළත් සියලුම කර්මාන්ත, කර්මාන්ත බදු පිළිබඳ ලේඛනයේ ඇතුළත් කළ යුතු වුවත්, ගාස්තු ගෙවන ව්‍යාපාර පමණක් ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කර තිබුණි. බදු නොගෙවන කර්මාන්ත පිළිබඳව ලේඛනවල ඇතුළත් නොවූ අතර ඒ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | -එම- | අදාළ රීති උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. |
| (ii) | 218 රීතිය | රීතිය ප්‍රකාරව පත් කළ මණ්ඩලයක් විසින් වාර්ෂික ඉඩම් ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | පළාත් පාලන චක්‍රලේඛ | | | |
| (i) | අංක 2018/elocal government 01 හා 2018/07/19 දිනැති චක්‍රලේඛය | අන්තර්ජාලය හරහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට හා ගෙවීම් කටයුතු කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | චක්‍රලේඛය අනුව ක්‍රියා කළ යුතුය. |
| (ii) | අංක 03/2015 හා 2015/11/02 දිනැති චක්‍රලේඛය | වීදි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.53,217,456 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.63,416,758ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 වර්ෂය | | | | 2022 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 3,750 | 4,329 | 4,474 | 798 | 3,609 | 3,851 | 3,797 | 887 |
| කුලී | 11,871 | 11,136 | 11,130 | 2 | 10,984 | 10,537 | 10,556 | 5 |
| බලපත්‍ර ගාස්තු | 1,163 | 1,041 | 1,104 | - | 1,160 | 1,064 | 1,064 | - |
| වෙනත් ආදායම් | 21,201 | 10,501 | 10,502 | 164 | 15,669 | 18,785 | 17,867 | 330 |
| එකතුව | 37,985 | 27,007 | 27,210 | 964 | 31,422 | 34,237 | 33,284 | 1,222 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති හිඟ වරිපනම් ශේෂය රු.554,764 ක් හා අක්කර බදු රු.243,365 ක ශේෂයක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | හිඟ වරිපනම් බදු කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.17,239,937 ක් හා මුද්දර ගාස්තු රු.81,676,048 ක් විය. | -එම- | උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව සතුව පැවති අවම ලංසු වටිනාකම රු.524,340 ක් වූ බදුදිය හැකි එළඳා ඉඩම් 19 ක් හා බදුදිය හැකි දේපල 08 ක් 2023 වර්ෂය තුළ දී බදු දී ආදායම් උත්පාදනය සඳහා යොදවා නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ආදායම් උත්පාදනය සඳහා යෙදවිය යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම.**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් ප්‍රාග්ධන වැය රු.601,490 ක් හා පුනරාවර්තන වැය රු.676,773 ක් දරා තිබුණ ද කසළ අලෙවියෙන් ලද ආදායම රු.75,050 ක් වී තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | දිරන හා නොදිරන කසල නිසි පරිදි කළමනාකරණය කිරීමටත් ආදායම් උත්පාදනය කටයුතු වර්ධනය කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 09 ක වටිනාකම රු.115,184,826 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | අයවිය යුතු ශේෂ කඩිනමින් අය කර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 16 ක එකතු වටිනාකම රු.60,103,391 ක් විය. | -එම- | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ඇ) | සභාව විසින් වාර්ෂිකව සිදු කරන කර්මාන්ත වෙළඳ ව්‍යාපාර ආයතන සමීක්ෂණය විධිමත් පරිදි සිදු නොකිරීම හේතුවෙන් සභාවට උපයාගත හැකිව තිබූ ආදායමක් උපයා ගැනීමේ අවස්ථාව අහිමි වීම හෝ එම ආදායම ඉපයීමට අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී ඇත. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | කර්මාන්ත වෙළඳ ව්‍යාපාර ආයතන සමීක්ෂණය විධිමත් පරිදි සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව විසින් විවිධ හේතු මත ප්‍රතික්ෂේප කරන ලද ගොඩනැගිලි අයදුම්පත් සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදුකර එම ඉදිකිරීම් සිදුකර තිබේ ද නැද්ද යන්න සොයා බැලීමට උචිත හා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | -එම- | ගොඩනැගිලි අයදුම්පත් සම්බන්ධයෙන් උචිත සහ ප්‍රමාණවත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

**3.3 නිෂ්කායර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත් හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා රථ ගාලෙහි ගාල්කර ඇති 31 ශ්‍රී 1367 දරන ජීප් රථය සභාවට ලද දිනය හෝ ලද ආකාරය පිළිබඳව තොරතුරු සභාව සතුව නොතිබූ අතර, මෙම රථයට අදාළව පවත්වා ගෙන යන ලොග් පොතට අනුව 2013 වර්ෂයේ සිට භාවිත කර ඇති බව අනාවරණය විය. මේ වන විට ජීප් රථය ඉතා අබලන් තත්ත්වයේ පවතින අතර ඒ පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | නිශ්ක්‍රීය වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කරන පෙර පාසල් 02 ක් , නළ ළිං 15 ක් අක්‍රීය මට්ටමේ පවතින අතර පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිලි පරිශ්‍රයේ පිහිටි කාය වර්ධන මධ්‍යස්ථානය සහ එහි උපකරණ ඌන උපයෝජිතව පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | නිශ්ක්‍රීය වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් ගොඩනැගිලි, ලී බඩු උපකරණ සහ වාහන සහ යන්ත්‍රෝපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු වීදි පහන් අංකනය කර නොතිබූ අතර, 2022 වර්ෂයෙන් පසු සවි කරන ලද වීදි පහන් තොරතුරු ලේඛනගතව ද නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සභාව විසින් පරිහරණය කරනු ලබන කැබ් රථ 02 ක සහ යතුරුපැදියක අයිතිය ද සභාව විසින් නඩත්තු කරන සුසාන භූමි 107 කින් 102 ක අයිතිය ද නළ ළිං 64 ක් පිහිටි භූමිවල අයිතිය ද කිතලව සතිපොල හා පුස්තකාලය පිහිටි ඉඩම්වල අයිතිය ද සමාලෝචිත වර්ෂය අවසාන දිනවන විටත් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | වත්කම්වල අයිතිය විධිමත් ලෙස සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මෝටර් ග්‍රේඩර් රථය සහ ට්‍රැක්ටර් රථ දෙකකට අමුණා ඇති සුදු යකඩ බවුසර් දෙක මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | අදාළ නෛතික ආයතනවල ලියාපදිංචි කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 16 ක් හා අතිරික්ත 30 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | කාර්යය මණ්ඩල අවශ්‍යතාවය කාලීනව සමාලෝචනය කර ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉටුකළ යුතු කර්තව්‍යයන් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද , එහි දී හඳුනාගත් විශේෂිත ක්‍රියාකාරකම් 24 ක් අතුරින් 6ක ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක හා ක්‍රියාකාරකම් 6 ක ප්‍රගතිය සියයට 50 ක් සියයට 75 ත් අතර මට්ටමක පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය වර්ධනය කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් විෂයයන් 04 ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 25 ක සිට සියයට 94 ක් දක්වා විචලනයන් පැවති අතර වියදම් විෂයයන් 04 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සියයට 20 කට වඩා වැඩි විචලනයක් පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. | වසර මුල ආදායම් හා වියදම් සම්බන්ධයෙන් පුරෝකථනයක් සිදු කර අයවැය ලේඛනය සකස් කළ යුතුය. |